**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2020**

----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" හා මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 79 (ආ) වගන්තිය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් පවත්වාගෙන යනු ලබන සංචිතවල ස්වාභාවය හා අරමුණු පිළිබඳව මූල්‍යප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ලාභාංශ සම කිරීමේ සංචිතය හා වෙනත් සංචිත යන සංචිත දෙක සම්බන්ධයෙන් එසේ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | මණ්ඩලයේ සංචිත වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ වෙන් වෙන්ව පෙන්වා ඇත. මණ්ඩලය විසින් වෙනත් සංචිත යටතේ දක්වා ඇත්තේ ආයුගණක ලාභ/අලාභ වේ. එය තවදුරටත් හෙළිදරව් කිරිමට අවශ්‍යවේ නම් ඉදිරියේදී හෙළිදරව් කිරිමට කටයුතු කරන්නෙමු. | ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකළ යුතු වීම. |
| (ආ)ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 73 (අ) ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ධාරණ අගය තීරණය කිරීම සඳහා යොදාගත් මිණුම් පදනම (Measurement Base) මූල්‍යප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, වත්කම් ප්‍රථමයෙන් හඳුනා ගැනිමෙන් පසුව එළඹෙන කාලපරිච්ඡේද වලදී ධාරණ අගය තීරණය කිරිම සඳහා (Measumentafter recognition) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 29 ඡේදයට අනුව මණ්ඩලය විසින් එහි ජංගම නොවන වත්කම් පිරිවැය ආකෘතිය මත මිණුම්ගත කරනු ලබයි. තවදුරටත් හෙළිදරව් කිරිමට අවශ්‍ය වන්නේ නම් ඉදිරියේදී හෙළිදරව් කිරිමට පියවර ගන්නෙමු. | ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| අනුගමනය කරන ලද පදනම (පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණනය ආකෘතිය) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 1981 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සේවායෝජකයින් 8,213 කගෙන් අයකරගෙන තිබූ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 943.78 ක් වූ දායක මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර සේවායෝජක ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි. අදාල සාමාජික ගිණුම් හඳුනාගෙන එම ගිණුම්වලට බැර කිරීමෙන් තොරව මෙසේ රඳවාගෙන තිබීමෙන් අදාල සාමාජිකයන්ට තම මුදල් අහිමි වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2021 අගෝස්තු 16 දිනට මෙම ශේෂයෙන් රු.මිලියන 381.86 ක් නිරවුල් කරන ලද බව මණ්ඩලයේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි. | සේවායෝජකයින් විසින් තම සේවකයන්ගේ දායක මුදල් විස්තර ඇතුලත් කරමින් ඉදිරිපත් කල යුතු වාර්තා ඉදිරිපත් නොකර තිබීම හා ඉදිරිපත් කර ඇති වාර්තාවල අඩුපාඩු පැවතීම නිසා මෙම මුදල් විභාජනය ප්‍රමාදව ඇත. තවද, වර්තමානයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය මත ක්ෂේත්‍ර නිලධාරීන්ට ආදාල ආයතනවලට ගොස් මෙම වාර්තා ලබා ගැනීම සහ/ හෝ නිවැරදි කර ගැනීමේ අවස්ථාව අහිමි වී ඇත. | දායක මුදල් බැරවිය යුතු සාමාජිකයන් නිවැරදිව හා කඩිනමින් හඳුනාගත හැකි ආකාරයට සමාජික මුදල් අයකිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරිම හා හඳුනා නොගත් සාමාජික තොරතුරු කඩිනමින් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | අතිකාල සඳහා ගෙවීම් කිරීමේ දී අතිකාල පැයකට සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් අතිකාල පැයකට පැය එක හමාරක් සහ සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ | මණ්ඩලයේ අතිකාල සඳහා සේවකයෙකු මසකට දින දෙකක් පමණක් අනුමැතිය ලබා දීමටත් මාසයේ පළමු හා අවසාන සෙනසුරාදා දින වල පමණක් අතිකාල සේවයේ යෙදවීමටත් | සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස අතිකාල සහ නිවාඩු සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | විමත් සමඟ දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ අතිකාල පිරිවැය රු.මිලියන 13.53 ක් වී තිබුණි. තවද, පනත ප්‍රකාරව මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් ඉඩ දී ඇති නමුත් ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබා ගැනීමට හා සතියකට දින 5 ක් පමණක් සේවය කිරීමට ඉඩ දී තිබුණි. | රීති සකස් කර ඒ අනුව කටයුතු කර ඇත. සාප්පු හා කාර්යාල පනත යටතේ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය හැර සියළුම රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන තුල වෛද්‍ය නිවාඩු දින 21 ක හිමිකම පවතින අතර බොහෝ ආයතන වල වාර්ෂික ඉතිරි වන වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් ද පවතින බව සඳහන් කරමි. | |
| (ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ 2014 නොවැම්බර් 10 දිනැති අංක PE/IN/ETF/Gen දරන ලිපිය | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට නිවාස ණය ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සියයට 4.2 ක පොලී අනුපාතය යටතේ එම ණය ලබාදීමට එකඟතාවය පල කර තිබුණ ද මණ්ඩලය විසින් සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 02 දක්වා සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය ලබා දී තිබුණි. | 2021 මැයි 21 දින බැංකුව සමඟ එළඹි නව ගිවිසුම ප්‍රකාරව ණය නිකුත් කිරීමේදී පළමු මිලියන 2 ක සඳහා සියයට 4.2 කද, ඉතිරි මිලියනය සඳහා සියයට 7කද පොළියක් අය කරනු ලබයි. | මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය අනුව නිවාස ණය සඳහා පොළී අයකල යුතුවීම. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2වගන්තිය | මණ්ඩලයෙහි දැනට ක්‍රියාත්මක වන මූල්‍ය හා පරිපාලන කාර්යය පරිපාටි සංග්‍රහයන් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙහෙයුම් කටයුතු ඉටුකරගැනිමේ පහසුව සඳහා අභ්‍යන්තරව සකසන ලද මූල්‍ය කාර්යය පටිපාටියක් භාවිතා කරනු ලබයි. මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන කාර්යය පටිපාටි සංග්‍රහයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, ඒවා | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනිම සඳහා කටයුතු කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | යාවත්කාලින කොට භාණ්ඩාගරයේ අනුමැතිය සඳහා ඉදිරියේදි ඉදිරිපත් කිරිමට සැලසුම් කර ඇත. | |
| (ඈ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති හා පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ නිසි අවසරයකින් තොරව සේවකයන්ට හා අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින්ට අතිරේක දීමනා, දිරිදීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ නොගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී ආහාර දිමනා ලෙස රු.මිලියන 11.34 ක් ද, ඉතිරි කරගත් නිවාඩු මත දිමනා ලෙස රු.මිලියන 25.02 ක්ද, වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණයන් ලෙස රු.මිලියන 91.06 ක්ද, නිවාස ණය පොළී ප්‍රතිපූර්ණයක් ලෙස රු.මිලියන 10.48 ක්ද, ලෙස එකතුව රු.මිලියන 137.90 ක් මහා භාණ්ඩාගාරයේ නිසි අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන ආහාර දීමනාව, ඉතිරි නිවාඩු දින 14 ක් සඳහා ගෙවීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ මණ්ඩල අනුමැතිය මත ලබා දුන් ප්‍රතිලාභ වේ. මේ සම්බන්ධව මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක PE/IN/ETF/Gen සහ 2014 නොවැම්බර් 10 දිනැති ලිපිය මඟින් දිරි දීමනා ශිර්ෂ යටතේ මෙම සියළු දීමනා සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. එසේම අදාල දිනයෙන් පසුව කාර්ය මණ්ඩලයට වෙනත් නව දීමනා හඳුන්වා දීමක් සිදු නොවූ බවත් එතෙක් පැවති දිරි දීමනා ක්‍රමවේදය ක්‍රියාත්මක කරමින් තිබෙන බවත් සඳහන් කරමු. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සියලුම දීමනා ක්‍රමයන් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

**1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.7.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතුව පැවති ණයකර පොළී මුදල්වලින් තවදුරටත් ලැබිය යුතු රු.මිලියන | මෙම හිඟ මුදල් ගෙවන ලෙස ඇල්කඩුව වැවිලි සමාගමට ලිපි කිහිපයක් යවා ඇත. අවසන් වරට 2021 ජුලි 12 දින ලිපියක් යවා ඇත. ඔවුන් දුරකථනයෙන් පවසා සිටින්නේ කොවිඩ් තත්ත්වය හමුවේ සමාගම | පසු විපරම් කටයුතු සිදුකළ යුතු වීම. |

| | |
|---|---|
| 9.39 ක් 2021 ජූලි 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | මූල්‍ය අපහසුතාවයට පත්ව ඇති බවයි. මෙම කටයුත්තට අදාල වන මුදල පොළිය නොගෙවීමක් බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් එම මුදල් එකවර අයකර ගැනිමට ඉඩ කඩ ඉතා විරලය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩල නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා බැංකුව සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව සේවකයින්ගෙන් ආපසු අයකර ගන්නා මූලික මුදල් හා පොළි මුදල්මාස 03කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කලයුතු වේ. එසේ වුවද, ඊට පටහැනිව බැංකුව විසින් එම මුදල් වර්ෂය අවසානයේ දී තැන්පත් ගිණුමේ ශේෂයට එකතු කර පෙන්වන බව විගණනයේදී නිරීක්ෂණ විය. ඒ හේතුවෙන් වර්ෂයතුළදී එකතු කරන මුදල් හා පොළී මුදල් වෙනුවෙන් අදාළ වර්ෂය සඳහා මණ්ඩලයට කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවන බව ද එම මුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදාගත නොහැකි වන බව ද නිරීක්ෂණය විය. ඒ අනුව 2020 වර්ෂයේ ණය නැවත අයකර ගැනිම් රු.මිලියන 24.47 හා පොළි අයකර ගැනිම් රු. මිලියන 6.15 ක් සඳහා ප්‍රතිලාභ කිසිවක් ලැබී නොතිබුණි. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වරින් වර දැනුවත් කලද එම ණය නැවත අයවීම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොමැත. 2021 මැයි 21 සිට ක්‍රියාත්මක නව ගිවිසුම්ට අනුව ණය නැවත අයවීම් මාස 03 කට වරක් අයකර ගැනිම විධිමත්ව සිදු කිරිමට කටයුතු යොදා ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 28,017 ක් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 28,007 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින්රු.මිලියන 25,149 ක් හා රු.මිලියන 25,411 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 2,868 කින් හා රු.මිලියන 2,596කින් වර්ධනයවී තිබුණි. සමාලෝචිත වර්ෂයෙදී මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 1,843 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 20 (1) වගන්තිය හා 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල (සංශෝධන) පනතේ 7 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන ප්‍රකාරව, මණ්ඩලයට ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කර ගැනීමට ඉඩකඩ සලසා දී ඇත. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ වාර්තාගත වී ඇති ස්වයං රැකියාලාභීන් 2,746,711 කින් සාමාජිකයින් ලෙස අරමුදලට ලියාපදිංචි කර ගෙන ඇති සංඛ්‍යාව 42,694 ක් හෙවත් සියයට 1.55 ක් පමණක් වූ අතර එයින් ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව 5,308 ක් විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුල වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුල උපායමාර්ග දක්වා තිබුණ ද, 2020 වර්ෂයේ දී අලුතින් ලියාපදිංචි කර ගෙන තිබූ සංඛ්‍යාව 481 ක් පමණක් විය. | 2019 වර්ෂයේදි හදුන්වා දුන් නව්‍යකරණ වැඩ සටහන යටතේ 2019 දෙසැම්බර් 31 දිනට නව සාමාජිකයින් 1614 දෙනෙක් බඳවා ගෙන ඇත. එම නව්‍යකරණ වැඩසටහන යටතේ 2020 වර්ෂයට ඉදිරි සැලසුම් ඉදිරිපත් කර ඇතත් කොරෝනා වසංගත තත්ත්වය තුල ක්‍රියාත්මක කිරිමට නොහැකි වි ඇත. | ස්වයං රැකියාලාභින් ලියාපදිංචි කර ගැනිම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු.මිලියන 17.47 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු.මිලියන 26.85 ක් වශයෙන් එකතුව රු.මිලියන 44.32 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සාමාජිකයන්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයන්ගේ ප්‍රතිලාභ සඳහා හිමිකම්ලාභීන් කීපදෙනෙකු සිටින අවස්ථාවල එකී හිමිකම්ලාභීන් සියලුදෙනාම එකවර ඉදිරිපත් නොවීම සහ ඇතැම් අය ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ඔවුන්ගේ කොටස් මණ්ඩල ගිණුමේ රඳවාගෙන ලේඛන ඉදිරිපත්කර ඇති අයගේ කොටස් පමණක් ගෙවීම් කිරීම වර්තමානයේ අනුගමනය කරන ක්‍රමවේදය වේ. | නිරවුල් නොකර පවතින හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ, රඳවාගත් ප්‍රතිලාභ වෙන් වෙන්ව හඳුනාගෙන නිරවුල් කිරීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඇ) | මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී ඉතිරි කර ගත් නිවාඩු මත රු.මිලියන 18.15 ක් ගෙවා තිබූ අතර වසංගත තත්ත්වය නිසා නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රම හඳුන්වා දී තිබූ 2020 වර්ෂයේදී රු.මිලියන 25.02 ක් ද වැයකර තිබුණි. මෙහි සාධාරණත්වය පිළිබඳ ගැටලු පැන නගී. | සේවකයින් විසින් ඉතිරි කර ගන්නා වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කිරීම වසර 30 කට පමණ පෙර ඇරඹි ක්‍රමවේදයන් වන අතර එය තවදුරටත් සේවකයන් ලබා ගන්නා නිවාඩු ප්‍රමාණය අඩු කරලීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයක් වන බව, සඳහන් කරමි. | සාමාජිකයින්ගේ දායක මුදල් වලින් සමන්විත සාමාජික අරමුදලින් වියදම් දැරීමේ දී මනා කළමනාකරණයකින් හා සැලැස්මකින් යුක්තව කටයුතු කළ යුතුවීම. |
| (ඈ) | මණ්ඩලයේ සාමාජිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා සාමාජිකයා, කාලත්‍රයා සහ සෑම යැපෙන්නෙක් වෙනුවෙන්ම එක් අයෙක් සඳහා මාස්පතා අයකරනු ලබන දායක මුදල රු. 30 ක් ලෙස 2011/10 අංක දරන පරිපාලන හා මානව සම්පත් චක්‍රලේඛනය මගින් සංශෝධනය කිරීමෙන් අනතුරුව වසර 10 ක් තුල එම මුදලේ සංශෝධනයක් සිදුව නොතිබුණි. එහෙත්, 2020 වසර සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ වියදම රු.මිලියන 92.57 ක් වූ අතර ඒ | ඉදිරියේදී දායක මුදල වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සේවකයාගෙන් යැපෙන රැකියා විරහිත අවිවාහක දරුවන්ගේ උපරිම වයස අවුරුදු 25 ක් ලෙස මෑතකදී තීරණය කර ඇත. වයස 21 ට වැඩි දරුවන්ට අදාලව වෛද්‍යාධාර ගෙවීම්වලදී ග්‍රාම නිලධාරී සහතික/ උසස් අධ්‍යාපන | සාමාජිකයින්ගේ දායක මුදල් වලින් සමන්විත සාමාජික අරමුදලින් වියදම් දැරීමේ දී මනා කළමනාකරණයකින් හා සැලසුමකින් යුක්තව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | සඳහා සාමාජික දායකත්වය රු.මිලියන 1.51 ක් එනම් සියයට 1.6 ක් පමණක් විය. ඒ අනුව ඉතිරි මුදල වූ රු.මිලියන 91.06 ක් එනම්, සියයට 98.4 ක් මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි.<br>තවද, 2006/25 අංක හා 2006 අගෝස්තු 31 දිනැතිව මණ්ඩලයේ පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් නිකුත්කර තිබූ චක්‍රලේඛනයට අනුව "සේවකයාගෙන් යැපෙන රැකියා විරහිත අවිවාහක දරුවන්" මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන බව සඳහන් කර තිබුණද, දරුවන් සඳහා උපරිම වයස් සීමාවක් නිර්ණය කර නොතිබීම, දරුවන් රැකියා කරන්නේද නැද්ද යන්න පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම, විවාහක අවිවාහක බව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම ආදී දුර්වලතාද, රෝහල්ගත නොවී ලබන ප්‍රතිකාර යටතේ විශේෂ උපකරණ ලබා ගැනීමේ දී වසර දෙකකට වරක් රු. 5,000 ක උපරිමයකට යටත්ව ප්‍රතිපූර්ණය කල හැකිය යන්න දක්වා තිබුණද, එම බිල්පත් සම්බන්ධයෙන් විශේෂ සඳහනක් පරිගණක පද්ධතියට ඇතුළත් නොකරන බැවින් අදාල කොන්දේසිය පරීක්ෂා කිරීමක් සිදු නොවීමත් ආදී අභ්‍යන්තර පාලන පද්ධති දුර්වලතාද නිරීක්ෂණය විය. | ආයතනවල සහතික ආදිය මගින් රැකියා නොකරන බව හා අවිවාහක බව තහවුරු කරගනු ලැබේ. විශේෂ උපකරණ ලබාදිමේ දී වසර දෙකකට වරක් රු.5,000 ක් දක්වා ප්‍රතිපූර්ණය කිරීමට අදාලව පරිගනක පද්ධතිය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයාද වන්නේය. කෙසේ වුවද, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණි. එසේ වුවද, 2020 වර්ෂය අවසාන වන විටත් පනතට අවශ්‍ය සංශෝධනයක් සිදුකර නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාපත්කල හැකි වන පරිදි පනත සංශෝධනය කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව අදාල යෝජනා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිම සඳහා විෂය භාර අමාත්‍යංශය වන මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත යොමු කර ඇත. | අදාල අනුමැතීන් කඩිනමින් ලබාගෙන පනතෙහි සංශෝධනයන් සිදු කිරිමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි. | මෙම පහසුකම් ලබා ගැනිම සඳහා හා පවත්වා ගෙන යෑම සඳහා අධික පිරිවැයක් මණ්ඩලයට දැරිමට සිදු වේ. සේවක බඳවා ගැනිම් සම්පූර්ණ කිරිමෙන් පසුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිමෙන් පසුව මෙම පහසුකම ලබා ගැනීම සඳහා මහ බැංකුව විසින් දන්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගැනිම සඳහා කටයුතු සිදු කරනු ඇත. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකිම වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 6 ක සිදුකර තිබූ පිළිවෙලින් රු.මිලියන 31.41 ක් හා රු.මිලියන 49.10 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා පිළිවෙලින් 2015, 2018 හා 2019 වර්ෂයේ සිට ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. | සමාගම්වල කොටස් ආයෝජනයෙන් ලාභාංශ ලැබීම හෝ නොලැබීම ඒ සමාගම්වල ක්‍රියාකාරිත්වය මත රඳා පවතී. එමෙන්ම එයට අභ්‍යන්තර හා බාහිර සාධකද බලපානු ලැබේ. මේ අනුව 2020 වසරේ රටතුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා බොහෝ සමාගම් වල දෛනික කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාමට නොහැකි වූ අතර ලාභාංශ ප්‍රකාශ කිරීමට ද නොහැකි තත්ත්වයක් උදා වී තිබුණි. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු වීම. |
| (ආ) | මණ්ඩලය විසින් ලැයිස්තුගත සමාගම් 12 ක සිදුකර තිබූ ආයෝජනවල 2015 වර්ෂයේ දී වෙළඳපොළ අගය රු.මිලියන 902.71 ක් වූ අතර 2015 වර්ෂයේ සිට එම කොටස්, කොටස් වෙළඳපොලේ ගනුදෙනු සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින් | මෙම සමාගම් කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි ප්‍රධාන පෙළේ සමාගම් බැවින් ඒවායේ වෙළඳපොළ මිල සත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නා විට විකුණා ලාභ ලැබීමට අපේක්ෂා කරමු. මෙම | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයට ප්‍රාග්ධන අලාභ අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම කොටස්වල වෙළඳපළ අගය රු.මිලියන 553.10 ක් දක්වා පහත වැටී තිබුණි. | සියළුම ආයෝජන දීර්ඝකාලීන ආයෝජන කළඹ තුල තිබෙන සමාගම් වේ. | |
| (ඇ) | මණ්ඩලය විසින් ඒකක භාර අරමුදල් තුනක ආයෝජනය කර තිබූ අතර ඉන් නාමල් වර්ධන අරමුදලේ 2020 වන විට ඒකක 450,000 ක ශේෂයක් විය. මෙය වර්ධන අරමුලක් වීම නිසා ලාභාංශ ගෙවීම අනිවාර්යෙන් සිදු නොවන බැවින් 2020 වර්ෂයට ලාභාංශ ලැබී නොතිබුණි. නාමල් වර්ධන අරමුදලේ ඒකකවල වෙළඳපොල වටිනාකම 2020 වර්ෂයේ වර්ධනය වී තිබුණද 2019 හා 2020 වර්ෂයන්හිදී අරමුදල මූල්‍ය අලාභයක් ලබා ඇති බව එහි මූල්‍ය ප්‍රකාශන පරික්ෂාවේ දි නිරීක්ෂණය විය. තවද, එම අරමුදලේ ශුද්ධ වත්කම් (Net assets attributable to unit holders) අඩුවීමක් එනම් 2017 දී රු. මිලියන 703 ක් වූ ශුද්ධ වත්කම් වන වටිනාකම 2020 වන විට රු. මිලියන 350 ක් දක්වා අඩු වී තිබීමෙන් මෙම ආයෝජනයේ අවදානම් තත්ත්වයක් නිරීක්ෂණය කෙරේ. | ඒකක භාර ආයෝජන වලින් නාමල් වර්ධන අරමුදලේ ආයෝජනයෙන් සියයට 55 ක ප්‍රමාණයක් ක්‍රම ක්‍රමයෙන් විකුණන ලදි. දැනට ඉතිරිව ඇති ඒකක 450,000 ද වෙළෙඳපොලේ වාසි දායක තත්ත්වයන්ට මතු වූ විට ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට බලාපොරොත්තු වේ. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු විම. |
| (ඈ) | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් තාවකාලික ලියාපදිංචි අංක ලබා දි අනුව්‍යාජ (Dummy) සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගන්නා සේවායෝජකයින්ගෙන් ලැබෙන දායක මුදල් 'X' නමින් තාවකාලික ගිණුම්වල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව අදාල සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර 'X' ගිණුම්වල (AX සිට | 2017 සිට කම්කරු දෙපාර්තමේන්තුව සේවක අර්ථසාධක අරමුදල සමග මාසිකව ලියාපදිංචි තොරතුරු හුවමාරු කිරිමේ ක්‍රියාවලියක් සිදුවන අතර, එම තොරතුරු පදනම් කරගෙන අනුව්‍යාජ අංක ස්ථිර සේවායෝජක අංක වලට මාරුකිරිම සිදු කරයි. තවද, මෙම මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාල විසින් ආයතන පරික්ෂණ කිරිමේදී ලබා ගන්නා ස්ථිර සේවායෝජක අංක අනුවද | අනුව්‍යාජ අංක ස්ථිර සේවායෝජක අංක වලට මාරු කිරිම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරිම කළමනාකරණයේ වගකිම වේ. |

XX දක්වා) 2020 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂය රු.317,699,475 ක් විය. මෙම අනුව්‍යාජ සේවායෝජකයන් මණ්ඩලයේ සත්‍ය සේවායෝජකයන් ලෙස ලියාපදිංචි කර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් එම ගිණුම තුල පවත්වාගෙන යන දායක මුදල් සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීමට නොහැකිව පැවතුණි. සේවායෝජක විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපංදිංචි විමෙන් අනතුරුව එම තොරතුරු අප වෙත දැනුම් දෙන අවස්ථාද තිබෙන අතර එවිටද අනුව්‍යාජ අංක යටතේ ගෙවීම් කරන දායක මුදල් ස්ථිර සේවායෝජක අංක වලට මාරු කිරිම නිරන්තරයෙන් සිදු කරනු ලැබේ.